- ## කථකලි නර්තන සම්ප්‍රදාය

කතා ප්‍රවෘත්තියක් අභිනයෙන් හා නෘත්‍ය ලීලාවන්ගෙන් ඉදිරිපත් කරනු ලබන දෘශ්‍ය කාව්‍යයක් ලෙස කථකලි නර්තන සම්ප්‍රදායය හැඳින්විය හැකි ය. මෙහි නිජබිම දක්ෂිණ භාරතයෙහි කේරළ ප්‍රාන්තය යි. චෙරුතුරුණි, ගුරුවායූර්, කොචින්, ත්‍රිවැන්ද්‍රම් ආදි ප්‍රදේශවල කථකලි ප්‍රචලිත ව පවතී. දේව විශ්වාස පදනම් වූ මෙම නර්තන සම්ප්‍රදායය ආගමික පුද පූජා, ගැමි නැටුම් හා ගැමි නාටක ආශ්‍රයයෙන් බිහි වූවකි.

- ## ආරම්භය හා විකාශය

භගවතී පිදීම, දුර්ගා ඇදහීම යනාදි දේව විශ්වාසයන් හා බැඳි චකියාර්කුත්තු, ප්‍රබන්ධම් කුත්තු, කුඩියාට්ටම් වැනි පැරණි නෘත්‍ය නාටක විශේෂ කථකලියෙහි ආරම්භයට පාදක විය. මෙහි මූලිකත්වය ගෙන ක්‍රියා කළේ එහි විසූ චකියාර්වරුන් නැමැති බ්‍රාහ්මණයන් විම විශේෂත්වයකි. චකියාර්වරුන් දේව පූජා උත්සවවල දී සමූහ වශයෙන් ඉදිරිපත් කළ නර්තන කුඩි ආට්ටම් (කුඩියාට්ටම්) වූ අතර ඒක පුද්ගල නර්තන චකියාර් කුත්තු නම් විය. මෙම නැටුම් වීර කතා හා දේව කතා ආශ්‍රිත ව ගොඩනැඟිණි. එම නිසා මේවා තාණ්ඩව නෘත්‍යයන්ගෙන් සමන්විත විය. ස්ත්‍රී චරිත ද පිරිමින් විසින් ඉදිරිපත් කරන ලද අතර එය කුම්මි ආට්ටම් නම් විය.

16 වන සියවසේ කේරළයේ විසූ කොට්ටාරක්කරයේ තාම්පුරම් ප්‍රාදේශික රජු ශ්‍රී රාමයන්ගේ චරිතය අළලා නාට්‍ය අටක් නිර්මාණය කරන ලදි. එය රාමාට්ටම් නම් විය. කැලිකට්හි සැමොරින් රජු ශ්‍රී ක්‍රිෂ්ණාගේ චරිතය ඇසුරින් ක්‍රිෂ්ණාට්ටම් නිර්මාණය කළේ ය. රාමාට්ටම් අභිබවා ක්‍රිෂ්ණාට්ටම් ප්‍රසිද්ධ වූයෙන් රාමාට්ටම් නැවත සකස් කොට ඉදිරිපත් කෙරිණි.

රාමාට්ටම් හා ක්‍රිෂ්ණාට්ටම් යන ගැමි නාටක හා චක්කියර් කුත්තු හා කුඩි ආට්ටම් වැනි ගැමි නැටුම්වල ආභාසය ලබමින් මහාකවි වල්ලතෝල් නාරායනමෙනන් විසින් කථකලි නර්තන සම්ප්‍රදායය නිර්මාණය කරන ලදි. ඔහු 1930 දී කේරළ කලා මණ්ඩලම් නම් කථකලි උගන්වන ආයතනය පිහිටුවා කථකලි නර්තනය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කළේ ය.

කථකලි නර්තනයේ ප්‍රවීණයන් ලෙස ක්‍රිෂ්ණන් නායර්, කුංජු නායර් ආදීන් හැඳින්විය හැකි අතර, උදය ශංකර්, රාම්ගෝපාල් වැනි ශිල්පීහු වර්තමාන වේදිකාවට ගැළපෙන සේ කථකලි නර්තනය සකස් කළ අය වෙති.

- ## සංගීතය හා වාද්‍ය භාණ්ඩ

දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතය ආභාසයෙන් මෙහි සංගීතය සකස් වී ඇත. ගීත ගායනය කෙරෙනුයේ සංස්කෘත හා මලයාලම් භාෂාවෙනි. ගායනා නොමැති ව කථකලි රඟ දැක්විය නොහැකි ය. මෙහි ගායකයෝ දෙදෙනෙකි. ගායක කණ්ඩායමේ ප්‍රධානයා පොන්නානි වන අතර, අත්වැල් ගායකයා හෙවත් සහාය ගායකයා සිංකිට්/සිංගිඩි ලෙස හැඳින්වේ.

චෙන්ඩා හා මද්දලම් ප්‍රධාන වාද්‍ය භාණ්ඩ වේ. චෙන්ගිලම්, ඉලතාලම්, එඩැක්ක හා කුම්භු යන වාද්‍ය භාණ්ඩ ද වාදනය සඳහා යොදා ගැනේ.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)

චෙන්ඩාව




දවුලේ හැඩයට සමාන ය. මුහුණතක් උඩ පැත්තට සිටින ලෙස තබා කෝටු දෙකකින් වාදනය කරයි. එක් අතකින් සහ කෝටුවකින් වාදනය කරන අවස්ථා ද ඇත.

මද්දල



අවනද්ධ භාණ්ඩයකි.

චෙන්ගිලම්



විශාල ප්‍රමාණයේ පිත්තල තලියකි. ගායක කණ්ඩායමේ ප්‍රධානයා විසින් අතේ එල්ලා ගෙන කෝටුවකින් වාදනය කරයි.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)

ඉලතාලම්/එලතාලම්



දේශීය තාලපටට වඩා තරමක් විශාල තාලම්පටකි. සිංකිඩි විසින් වාදනය කරනු ලැබේ.

උඩැක්ක



උඩැක්කියේ ආකෘතිය සහිත වාද්‍ය භාණ්ඩයකි. කරේ එල්ලා ගෙන කෝටුවකින් වාදනය කෙරේ.

කුම්භු



ශුෂිර වාද්‍ය භාණ්ඩයකි.

- කථකලි සන්දර්ශනයක් කේලිකුත්තු, මද්දලකෙලි තෝඩායම්, පුරප්පාඩ, මේලප්පදම් යන අංගයන් ගෙන් සමන්විත වෙයි.
- භගවද්ගීතාව, රාමායණය වැනි කාව්‍ය ග්‍රන්ථවල එන කථා පුවෘත්ති ගායකයන් විසින් ඉදිරිපත් කරනු ලබන අතර. නර්තන ශිල්පීහු හස්ත මුද්‍රා හා අභිනය යොදා ගෙන ගායනයෙහි අදහස තැටුමෙන් නිරූපණය කරති.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)

- ## වේෂ නිරූපණය හා රංග වස්ත්‍රාභරණ

කථකලි ආහාර්යා අභිනයෙන් පොහොසත් නර්තන සම්ප්‍රදායයකි. චරිතවලට අනුව ඉතා විචිත්‍රවත් අයුරින් සැකසුණු රංග වස්ත්‍රාභරණ හා ඊට ම ගැළපෙන සංකීර්ණ වේෂ නිරූපණ භාවිත වෙයි. වේෂ නිරූපණ ශිල්පියා පත්තුකාරන් ලෙස හැඳින්වේ. මෙහි දී චරිත වර්ග හයකට වෙන් කර ඇත.

**මිනික්කු** : ඔප දමන ලද යන අරුත දෙයි.
කථකලිහි සාමාන්‍ය වේෂ නිරූපණ ක්‍රමය යි.

**පච්චා** : කොළ පැහැය වැඩි වශයෙන් භාවිත කරයි.

**කත්ති** : නාසයේ උඩ කෙළවරේ සිට නළල දෙසට තියුණු වක ගැසුණු පිහියක ස්වරූපයක් ගන්නා නිසා පිහිය යන අරුත දෙන කත්ති යන නාමය යෙදී ඇත.

**තාඩි** : රැවුළ යන අරුත් දෙයි. සුදු, කළු, රතු රැවුළ භාවිත වෙයි.

**කාරි** : භාසෝත්පාද ගණයට අයත් චරිත සඳහා මෙම ක්‍රමය යොදා ගැනේ.

**ඩෙප්පු** : නර්තන ශිල්පියා විසින් කරනු ලබන මූලික අංග රචනය යි.

- **හිස් පලඳනා වශයෙන් කිරීටම් (ඔටුනු) වර්ග තුනක් ද භාවිත කෙරෙයි.**

රංග වස්ත්‍රාභරණ :

1. කිරීටම් - හිස් ඔටුන්න
2. කළුතාරම් - කරට පලඳින මාල
3. කුප්පායම් - උඩුකයට අඳිනු ලබන අත්දිග හැට්ටය
4. උත්තරීයම් - කරවටා ඉණ දක්වා එල්ලා ඇති සුදු හා රතු පටි අගට රවුම් කණ්ණාඩියක් සවි කොට ඇත.
5. චෝරී - යටිකයට අඳින විශාල රෙද්දකි. මෙය උඩරට නැටුම් හගල මෙනි.

(10 ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත ඇසුරිණි.)